**අපස්මාරය පිළිබඳ රෝහලක් සහ සෞඛ්‍ය මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා වූ ව්‍යාපෘතිය - 2014**

---

අපස්මාරය පිළිබඳ රෝහලක් සහ සෞඛ්‍ය මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා වූ ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන , ශ්‍රී ලංකා රජය (ශ්‍රීලංර) සහ සංවර්ධනය සඳහා සෞදි අරමුදල (සංසඅ) අතර 2008 මාර්තු 26 දින එළඹි අංක 7/477 දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය වර්තමානයේ සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ මහ රෝහල් පරිශ්‍රයේ සම්පූර්ණ උපකරණ සහිත අපස්මාර රෝහලක් සහ සෞඛ්‍ය මධ්‍යස්ථානයක් ඉදිකිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 2,918 ක් වූ අතර ඉන් එ.ජ.ඩො මිලියන 20 කට (සෞදි රියාල් මිලියන 75) සමාන රු.මිලියන 2,273 ක්, සංවර්ධනය සඳහා වූ සෞදි අරමුදල විසින් සැපයීමට එකඟ විය. ව්‍යාපෘතිය එහි ක්‍රියාකාරකම් 2008 මාර්තු 26 දින ආරම්භ කළ අතර 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කිරීමට සැලසුම් කරන ලදී. පසුව ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2016 මාර්තු 31 දක්වා අවස්ථා තුනකදී දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට

අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**-----------------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 මතය**

**---------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව.

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**----------------------------------------**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

**---------------------------**

ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කළ පිරිවැය රු.278,296 ක් වූ ලී බඩු සහ පරිගණක උපකරණ, දේපල පිරියත හා කාර්යාල උපකරණ යටතේ ගිණුම්ගත කරනු වෙනුවට කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම් ගතකර තිබුණි.

### 2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන චක්‍රලේඛයේ 5.2 වගන්තියට අනුව අදාළ කාලපරිච්ඡේදය සඳහා රු.80,000 ක දීමනාවකට පමණක් හිමිකම් තිබියදී ව්‍යාපෘති අධ්‍යක්ෂක සමාලෝචිත වර්ෂයේදී රු.285,000 ක ඉන්ධන දීමනාවක් ලබා ගෙන තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂයේදී වාර්ෂික ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | සෞදි රියාල් මිලියන | රු.මිලියන | රු.මිලියන | සෞදි රියාල් මිලියන | රු.මිලියන | සෞදි රියාල් මිලියන | රු.මිලියන |
| සං.ස.අ | 75 | 2,273 | 1,920 | 7.42 | 262.38 | 35.25 | 1,188 |
| ශ්‍රී ලං ර | - | 645 | 200 | - | 104.84 | - | 247 |
| එකතුව | 75 | 2,918 | 2,120 | 7.42 | 367.22 | 35.25 | 1,435 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත තොරතුරු වලට අනුව ව්‍යාපෘතියේ කාර්යයන් ආරම්භ වී නියමිත කාලයෙන් වසර 6 ½ කට පසුත් ණය උපයෝජනය වී තිබුණේ සියයට 49.16 ක් පමණි.

(ආ) ණය ගිවිසුමට අනුව අපස්මාර රෝහල සඳහා වෛද්‍ය උපකරණ සැපයීම හා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.මිලියන 2,273 ක් වෙන් කර තිබුණි. 2014 දෙසැම්බර් 31 දිනට වෙන්කිරීම් උපයෝජනය කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සංරචකය | වෙන් කිරීම | ප්‍රදානය කළ කොන්ත්‍රාත් වටිනාකම | 2014 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ ප්‍රමාණය |
|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය | 1,008 | 337 | 337 |
| ප්‍රධාන ගොඩනැගිල්ල ඉදිකිරීම | | | |
| - පයිලින් | 970 | 91 | 80 |
| - ඉදිකිරීම | | 1,793 | 980 |
| උපදේශක සේවා | 190 | 224 | 205 |
| වෙන්කිරීම් නොකළ | 105 | - | - |
| | 2,273 | 2,445 | 1,602 |

ඉහත තොරතුරු වලට අනුව ගොඩනැගිලි ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා ණය ගිවිසුමෙන් වෙන්කර තිබුණේ රු.මිලියන 969.80 ක මුදලක් පමණක් වුවත් රු.මිලියන 1,793 කට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. තවද වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය කිරීමේ කොන්ත්‍රාත්තුව රු. මිලියන 337 කට ප්‍රදානය කර තිබුණ නමුත් ණය ගිවිසුමෙහි රු.මිලියන 1,008 ක මුදලක් වෙන්කර තිබුණි. තවදුරටත් 2015 ජුනි 10 දින සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් වෛද්‍ය උපකරණ, ලී බඩු, විදුලි උත්පාදන යන්ත්‍ර, උපදේශක සහ අමතර වියදම් පියවා ගැනීම සඳහා සෞදි අරමුදලින් රු.මිලියන 1,480 ක අමතර අරමුදල් ඉල්ලුම් කර තිබුණි.

### 3.2 භෞතික කාර්යසාධනය

අපස්මාර රෝහලේ ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු 2014 අප්‍රේල් 04 ට පෙර සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරුණි. කෙසේ වෙතත් 2014 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීමේ කටයුතුවල භෞතික ප්‍රගතිය සියයට 82 වුවත් මූල්‍ය ප්‍රගතිය සියයට 62 ක් බව වාර්තා විය.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති ගිවිසුමේ 2 උපලේඛනයට අනුව, රෝහල් ගොඩනැගිල්ල ඇඳන් 242 කින් සමන්විත වීමට සැලසුම් කෙරුණි. කෙසේ වෙතත් මුල් සැලැස්මේ ඇතුළත් නොවූ නව ඒකක කිහිපයක් මෙම නව ගොඩනැගිල්ල තුළ ස්ථාපිත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඇඳන් 152 කින් පමණක් සමන්විතව තිබූ බව භෞතික සත්‍යාක්ෂණයේදී තහවුරු විය.

(ආ) මහල් 10 කින් සමන්විත රෝහල් ගොඩනැගිල්ලේ දෙවන මහලේ උපකරණ ප්‍රදේශය සහ බිම් මහලේ චුම්භක අනුනාද ප්‍රතිරූපන ස්කෑනර් ප්‍රදේශය (Magnetic Resources Imaging Scanner) වෛද්‍ය උපකරණ මිලදී ගැනීම හා ස්ථාපනය කිරීමේ ප්‍රමාදය නිසා 2015 ජූලි 31 වන විටත් සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණි.

**3.4 මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ස්ථිර පදනම මත පුද්ගලයකු බඳවා ගැනීමට කටයුතු නොකර වසර 3 ½ කට වැඩි කාලයක් සඳහා රේඛීය අමාත්‍යාංශයේ නිලධාරියකු විසින් දිගින් දිගටම ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ආවරණය කරමින් තිබුණි. තවද මූල්‍ය කළමනාකරු, ව්‍යාපෘති ඉංජිනේරු (Bio Medical), ප්‍රසම්පාදන නිලධාරී සහ කාර්මික නිලධාරී තනතුරුවල රාජකාරීන්ද රේඛීය අමාත්‍යාංශයේ නිලධාරීන් විසින් අර්ධකාලීන පදනම මත ආවරණය කරමින් තිබුණි. ඊට අමතරව වෛද්‍ය සම්බන්ධීකරණ (Medical Coordinator) තනතුරු 2 ක් වසර තුනකට වැඩි කාලයක් පුරප්පාඩුව පැවතුණි. එවැනි ප්‍රධාන තනතුරු සඳහා සුදුසු පුද්ගලයන් බඳවාගෙන ඇබෑර්තු සම්පූර්ණ කිරීමේ ප්‍රමාදය ව්‍යාපෘතියේ කාර්යයන් පහසුවෙන් මෙහෙයවීම කෙරේ අහිතකර ලෙස බලපා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.213,990 ක් වූ දීමනා ගෙවා තිබියදීත් සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ නීති නිලධාරීගේ යොමුගත කොන්දේසි සහ ලබාගත් සේවාවල විස්තර ආදී සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.